සියලුම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

# 74 - පාලි

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අධ්‍යයනපොදු සහතික පත්‍ර (උසස්පෙළ) විභාගය - 2018

## 74 - පාලි

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

# ලකුණුදීමේ පටිපාටිය

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

1 පත්‍රයඃ කාලයඃ පැය 02 යි.

මෙම ප්‍රශ්න පත්‍රය වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50කින් සමන්විත ය. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු සංඛ්‍යාව 100කි.

2 පත්‍රයඃ කාලයඃ පැය 03 යි.

### I කොටස

1. ප්‍රශ්නය

(i) නිවැරදි ගද්‍ය පරිවර්තනයට හිමි ලකුණු සංඛ්‍යාව 10කි.

(ii) නිවැරදි පද්‍ය පරිවර්තනයට හිමි ලකුණු සංඛ්‍යාව 10කි. (ලකුණු 20 යි)

2. ප්‍රශ්නය

(i) නිවැරදි ගද්‍ය පරිවර්තනයට හිමි ලකුණු සංඛ්‍යාව 10කි.

(ii) එක් වැකියක් නිවැරදිව සිංහලට පරිවර්තනය කිරීමට ලකුණු 02 බැගින් 10කි.

(ලකුණු 20 යි)

### II කොටස

3. ප්‍රශ්නය

(i) එක් පිළිතුරකට එක ලකුණ බැගින් ලකුණු 02කි.

(ii) නිවැරදි පිළිතුරකට ලකුණු දෙක බැගින් ලකුණු 04කි.

(iii) සමස්ත පිළිතුරට හිමි ලකුණු සංඛ්‍යාව 06කි.

(iv) එක් කොටසකට ලකුණු හතර බැගින් ලකුණු 08කි. (ලකුණු 20 යි)

4. ප්‍රශ්නය

(i) එක් පිළිතුරකට එක ලකුණ බැගින් ලකුණු 02කි.

(ii) නිවැරදි පිළිතුරකට එක ලකුණ බැගින් ලකුණු 04කි.

(iii) එක් හැඳින්වීමකට ලකුණු දෙක බැගින් ලකුණු 06කි.

(iv) නිවැරදි පිළිතුරට හිමි ලකුණු සංඛ්‍යාව 08කි. (ලකුණු 20 යි)

5. ප්‍රශ්නය

(i) නිවැරදි එක් පිළිතුරකට ලකුණු භාගය බැගින් ලකුණු 05කි.

(ii) නිවැරදි එක් පිළිතුරකට ලකුණු භාගය බැගින් ලකුණු 05කි.

(iii) එක් වාක්‍යයක් නිවැරදි කිරීමකට එක ලකුණ බැගින් ලකුණු 05කි.

(iv) නිවැරදි එක් පිළිතුරකට එක ලකුණ බැගින් ලකුණු 05කි. (ලකුණු 20 යි)

6. ප්‍රශ්නය

(i) නිවැරදි පිළිතුරට හිමි ලකුණු සංඛ්‍යාව 05කි.

(ii) නිවැරදි එක් පැහැදිලි කිරීමකට එක ලකුණ බැගින් ලකුණු 05කි.

(iii) නිවැරදි පිළිතුරට හිමි ලකුණු සංඛ්‍යාව 05 කි.

(iv) නිවැරදි පිළිතුරට හිමි ලකුණු සංඛ්‍යාව 05 කි. (ලකුණු 20 යි)

2 පත්‍රය සඳහා මුළු ලකුණු - 100

**අවසාන ලකුණු ගණනය කිරීම: 1 පත්‍රය - 100**

**2 පත්‍රය - 100**

**අවසාන ලකුණු - 200 ÷ 2 = 100**

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන්ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ :ප්‍රශ්න අංක 03

(i) ..................................................
..................................................
.................................................. ✓ △ $\frac{4}{5}$

(ii) ..................................................
..................................................
.................................................. ✓ △ $\frac{3}{5}$

(iii) ..................................................
..................................................
.................................................. ✓ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස.(උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை- 2018

විෂය අංකය / பாட இலக்கம்: 74

විෂයය / பாடம்: පාලි

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 5 | 11. | 4 | 21. | 5 | 31. | 4 | 41. | 2 |
| 02. | 1 | 12. | 1 | 22. | 1 | 32. | 4 | 42. | 3 |
| 03. | 3 | 13. | 3 | 23. | 3 | 33. | 1 | 43. | 4 |
| 04. | 2 | 14. | 5 | 24. | 4 | 34. | 2 | 44. | 1 |
| 05. | 2 | 15. | 4 | 25. | 4 | 35. | 4 | 45. | 2 |
| 06. | 4 | 16. | 1 | 26. | 3 | 36. | 1 | 46. | 3 |
| 07. | 5 | 17. | 5 | 27. | 1 | 37. | 2 | 47. | 5 |
| 08. | 5 | 18. | 2 | 28. | 5 | 38. | 4 | 48. | 2 |
| 09. | 3 | 19. | 2 | 29. | 2 | 39. | 2 | 49. | 5 |
| 10. | 3 | 20. | 1 | 30. | 2 | 40. | 3 | 50. | 1 |

✪විශේෂ උපදෙස්/விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ஒரு சரியான விடைக்கு 02ලකුණුබැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50= 100

## I කොටස

**1. සිංහලට** නගන්න.

(i) තෙ තං සාසනං සුත්වා "සංසාරෙ විචරන්තානං න පුත්තො න ධීතා නාම නත්ථි, තෙ අම්හාකං මහාපරාධිකා, න සක්කා තෙහි අම්හාකං චක්ඛුපථෙ ඨාතුං, එත්තකං පන නාම ධනං ගහෙත්වා ද්වෙපි ජනා ඵාසුකට්ඨානං ගන්ත්වා ජීවන්තු, දාරකෙ පන ඉධ පෙසෙන්තූ"ති. සෙට්ඨිධීතා මාතාපිතූහි පෙසිතං ධනං ගහෙත්වා දාරකෙ ආගතදූතානංයෙව හත්ථෙ දත්වා පෙසෙසි, දාරකා අය්‍යකකුලෙ වඩ්ඪන්ති. තෙසු චූළපන්ථකො අතිදහරො, මහාපන්ථකො පන අය්‍යකෙන සද්ධිං දසබලස්ස ධම්මකථං සොතුං ගච්ඡති. තස්ස නිච්චං සත්ථු සම්මුඛා ධම්මං සුණන්තස්ස පබ්බජ්ජාය චිත්තං නමි. සො අය්‍යකං ආහ "සචෙ තුම්හෙ සම්පටිච්ඡථ, අහං පබ්බජෙය්‍ය"න්ති. "කිං වදෙසි, තාත, මය්හං සකලලොකස්සා'පි පබ්බජ්ජතො තවෙව පබ්බජ්ජා භද්දිකා, සචෙ සක්කොසි, පබ්බජ තාතා"ති සම්පටිච්ඡිත්වා සත්ථු සන්තිකං ගතො. (ලකුණු 10 යි.)

**1 (i) ආදර්ශ පරිවර්තනය.**

ඔවුහු ඒ පණිවිඩය අසා සසර සැරිසරන්නන්ට පුතෙක් නොවූවෙක් දූවක් නොවූවෙක් නම් නැත. ඔවුහු අපට මහත් අපරාධ කළාහු ය. ඔවුන් විසින් අපගේ ඇස් හමුවෙහි සිටීමට නො හැකි ය. මෙපමණ නම් ධනය ගෙන දෙදෙනා ම පහසු තැනකට ගොස් ජීවත් වෙත්වා, දරුවන් වනාහි මෙහි එවත්වා යනුවෙනි. සිටුදුව මව්පියන් විසින් යවන ලද ධනය ගෙන දරුවන් පැමිණි දූතයන්ගේ අතට ම දී යැව්වා ය. දරුවෝ මුත්තණු කුලයෙහි වැඩෙති. ඔවුන් අතරෙහි චූල්ලපන්ථක තෙමේ ඉතා ළදරු ය. මහාපන්ථක වනාහි මුත්තණුවන් සමග බුදුරදුන්ගේ බණකථා අසන්නට යයි. බුදුරදුන් ඉදිරියෙහි නිතර බණ අසන්නා වූ ඔහුගේ සිත පැවිද්ද පිණිස නැමුණි. හෙතෙම ඉදින් තෙපි පිළිගන්නාහු නම් මම පැවිදි වන්නෙමියි මුත්තණුවන්ට කීය. දරුව, කුමක් කියහි ද මට සියලු ලෝවැසියාගේ පැවිද්දට වඩා ඔබගේ පැවිද්ද ම යහපත් ය. ඉදින් හැකිනම් දරුව පැවිදි වෙවයි පිළිගෙන බුදුරදුන් වෙතට ගියේ ය.

(ii) අත්තානං චෙ පියං ජඤ්ඤා - රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං,
තිණ්ණමඤ්ඤතරං යාමං - පටිජග්ගෙය්‍ය පණ්ඩිතො.

අත්තානමෙව පඨමං - පතිරූපෙ නිවෙසයෙ,
අථඤ්ඤමනුසාසෙය්‍ය - න කිලිස්සෙය්‍ය පණ්ඩිතො.

අත්තා හි අත්තනො නාථො - කො හි නාථො පරො සියා,
අත්තනාව සුදන්තෙන - නාථං ලභති දුල්ලභං.

අත්තනාව කතං පාපං - අත්තජං අත්තසම්භවං
අභිමන්ථති දුම්මෙධං - වජිරං වස්මමයං මණිං. (ලකුණු 10 යි.)

**(ii) ආදර්ශ පරිවර්තනය.**

ඉදින් තමා (තමාට) ප්‍රිය යැයි දන්නේ නම්, තමා සුරක්ෂිතව රකින්නේ ය. නුවණැත්තා ජීවිතයේ ත්‍රිවිධ වූ යාමයන් අතුරෙන් එක්තරා යාමයක තමා පිළිදැගුම් කරන්නේ ය.

පළමුව තමා ම සුදුසු ගුණයෙහි පිහිටවන්නේ ය. අනතුරුව අනෙකෙකුට අනුශාසනා කරන්නේ ය. (එසේ කරන) නුවණැත්තා නො කෙළෙසෙන්නේ ය.

තමාගේ පිහිට තමා ම ය. අනෙක් කවරෙක් නම් පිහිට වන්නේ ද ? මනාව දැමුණු තමා ම දුර්ලභ වූ පිහිට ලබයි.

තමා කෙරෙහි හටගත්තා වූ, තමා කෙරෙන් උපන්නා වූ, තමා විසින් ම කරන ලද පාපය පාෂාණමය දියමන්තිය පාෂාණමය මැණික නසන්නාක් මෙන් අනුවණයා මැඩලයි.

**ලකුණු දීමේ ක්‍රමය**

(i) පාඨය සිංහලට නැඟීමේ දී නිවැරදි අර්ථ අවබෝධය සඳහා ලකුණු අටක් ද, එහි නිවැරදි සිංහල ව්‍යාකරණය සඳහා ලකුණු **දෙකක්** ද පිරිනමන්න. දුෂ්කර පද අත්හරිමින් හා මනඃකල්පිතව කර ඇති පරිවර්තන සඳහා සුදුසු පරිදි ලකුණු අඩු කරන්න. (ii) කොටසට ලකුණු දීමේ දී එක් ගාථාවකට ලකුණු **දෙක හමාර** බැගින් සලකා පළමු පාඨයට ලකුණු ප්‍රදානය කළ ආකාරයට ලකුණු දිය යුතු ය.

**2.** (i) **සිංහලට** නගන්න.

අතීතෙ ඉතො පඤ්චමෙ කප්පෙ බොධිසත්තො සෙරිවරට්ඨෙ කච්ඡපුටවාණිජො අහොසි. සො සෙරිවා නාම එකෙන ලොලකච්ඡපුටවාණිජෙන සද්ධිං නීලවාහිනිං නාම නදිං උත්තරිත්වා අන්ධපුරං නාමං නගරං පවිසන්තො නගරවීථියො භාජෙත්වා අත්තනො පත්තවීථියා භණ්ඩං වික්කිණන්තො විචරි. ඉතරො'පි අත්තනො පත්තවීථිං ගණ්හි. තස්මිං පන නගරෙ එකං සෙට්ඨිකුලං පරිජිණ්ණං අහොසි. සබ්බෙ පුත්තභාතිකා ච ධනං ච පරික්ඛයං අගමංසු. එකා දාරිකා අය්‍යකාය සද්ධිං අවසෙසා අහොසි. තා ද්වෙ'පි පරෙසං භතිං කත්වා ජීවන්ති. ගෙහෙ පන තාසං මහාසෙට්ඨිනා පරිභුත්තපුබ්බා සුවණ්ණපාති භාජනන්තරෙ නික්ඛිත්තා දීඝරත්තං අවලඤ්ජියමානා මලග්ගහිතා අහොසි. තා තස්සා සුවණ්ණපාතිභාවම්පි න ජානන්ති. සො ලොලවාණිජො තස්මිං සමයෙ "මණිකෙ ගණ්හථ, මණිකෙ ගණ්හථා'ති විචරන්තො තං ඝරද්වාරං පාපුණි. සා කුමාරිකා තං දිස්වා අය්‍යකං ආහ "අම්ම, මය්හං එකං පිළන්ධනං ගණ්හාහි. අම්ම, මයං දුග්ගතා, කිං දත්වා ගණ්හිස්සාමා'ති. "අයං නො පාති අත්ථි, නො ච අම්හාකං උපකාරා, ඉමං දත්වා ගණ්හා"ති. (ලකුණු 10 යි.)

---

**2 (i) ආදර්ශ පරිවර්තනය.**

පෙර මෙයින් පස්වන කල්පයෙහි බෝසත් තෙම සේරිව රටෙහි කච්ඡපුට වෙළෙන්දෙක් විය. හෙතෙම සේරිවා නම් එක් ලෝභී කච්ඡපුට වෙළෙන්දෙකු සමග නීලවාහිනී නම් ගඟෙන් එතෙරව අන්ධපුර නම් නගරයට පිවිසෙන්නේ නුවර වීදි බෙදා තමාට ලැබුණු වීදියෙහි බඩු විකුණමින් හැසිරුණේ ය. අනෙකා ද තමාට පැමිණි වීදිය ගත්තේ ය. ඒ නගරයෙහි වනාහි එක් ජරාජීර්ණ වූ සිටු කුලයක් විය. සියලු දරුවෝ ද සහෝදරයෝ ද ධනය ද ක්ෂය බවට ගියහ. එක් දැරියක් මිත්තණිය සමග ඉතිරි වූවා ය. ඒ දෙදෙනා ද අනුන්ට බැලමෙහෙකොට ජීවත් වෙති. ගෙහි වනාහි ඔවුන්ගේ මහ සිටුවරයා විසින් පෙර වළඳන ලද රන් පාත්‍රය බඳුන් අතර දමන ලද්දේ දිගුකලක් පරිභෝග නොකළ බැවින් මල බැඳුණේ විය. ඇලා එය රන් බඳුනක් බව ද නො දනිති. ඒ ලෝභී වෙළෙන්දා එසමයෙහි කදාවළලු ගනිව්, කදාවළලු ගනිව් යැයි ඇවිදින්නේ ඒ ගේ දොරට පැමිණියේ ය. ඒ කුමරිය ඔහු දැක මැණියනි, මට එක් පළඳනාවක් ගන්න යැයි මිත්තණියට කීවා ය. දරුව, අපි දුප්පත් ය. කුමක් දී ගන්නෙමු දැයි කීවා ය. අපගේ මේ පාත්‍රය ඇත. අපට ප්‍රයෝජන ද නැත. මෙය දී ගන්න යනුවෙනි.

(ii) **පාලියට** නගන්න.

(අ) දිනපතා භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කරති.

(ආ) කවදා ඔබගේ දරුවෝ ධර්මය අසන්නට විහාරයට යන්නහු ද?

(ඉ) ඇරියෝ වැවට ගොස් නා ගෙදර ආවාහු ය.

(ඊ) මිනිස්සු මැණික්වලින් නුවණ මිල දී ගන්නට නො හැක්කාහු වෙති.

(උ) පෙර මම මගේ මාමලාගේ (මාතුල) ගෙදර විසූයෙමි.

(ලකුණු 10 යි.)

**(ii) ආදර්ශ පරිවර්තනය.**

1. පතිදිනං භික්ඛූ භගවතො /භගවන්තං නමන්ති.
2. කදා තව දාරකා ධම්මං සොතුං විහාරං ගච්ඡිස්සන්ති ?
3. දාරිකායො වාපිං ගන්ත්වා නහායිත්වා ගෙහං ආගච්ඡිංසු.
4. මනුස්සා මණිහි මතිං කිණිතුං න සක්කොන්ති.
5. පුරා අහං මම මාතුලානං ගෙහෙ අවසිං.

**ලකුණු දීමේ ක්‍රමය**

(i) මෙම කොටසට ලකුණු දීමේ දී (1) ප්‍රශ්නයේ (i) පාඨයට ලකුණු දීමේ දී අනුගමනය කළ ක්‍රමවේදය අනුගමනය කරන්න.

(ii) කොටසට ලකුණු දීමේ දී නිවැරදි එක් වාක්‍යයකට ලකුණු **දෙක** බැගින් හිමි වේ. **දෝෂ එකක්** ඇත්නම් වාක්‍යයකට උපරිමය ලකුණු **එකකි.** දෝෂ එකකට වඩා ඇත්නම් ලකුණු හිමි නො වේ. සමස්තයේ වචනය භාවිතය සලකා ලකුණු දෙන්නේ නම් ලකුණු 04 උපරිමය ලෙස සලකන්න.

## II කොටස

**3.** (i) පාලි භාෂාවේ ප්‍රභවය භාරතයෙන් බැහැර තැනකදී සිදු වූවක් බව දැක්වූ පඬිවරයාගේ නම සහ පාලි භාෂාවේ ප්‍රභවය සිදු වූ තැන ලෙස ඔහු දැක් වූ ස්ථානය නම් කරන්න

(ii) **"සා මාගධී මූලභාසා ..."** යනාදි ගාථාව නිවැරදිව ලියා, එයින් කියැවෙන අදහස දක්වන්න.

(iii) විනය පිටකයේ විවිධ ප්‍රභේද ගෙනහැර දක්වන්න.

(iv) භාණකවරු යනු කවරහු දැයි හඳුන්වා ඔවුන්ගේ කාර්යභාරය කුමක් වී දැයි පෙන්වා දෙන්න.

(ලකුණු 2+4+6+8=20 යි.)

**ආදර්ශ පිළිතුර**

(i) C.H.Z. වික්‍රමසිංහ මහතා

ස්ථානය - අනුරාධපුර මහාවිහාරය

(ii) සා මාගධී මූලභාසා - නරා යායාදිකප්පිකා,
බ්‍රහ්මානො චස්සුතාලාපා - සම්බුද්ධා චාපි භාසරෙ.

යම් භාෂාවකින් ආදිකල්පික මිනිස්සු ද බ්‍රහ්මයෝ ද නො ඇසූ කථා ඇත්තෝ ද බුදුවරු ද කථා කළාහු නම්, ඒ මාගධී භාෂාව මූලභාෂාව යි.

(iii)

- විනය පිටකය **උභතො විභංග, ඛන්ධක, පරිවාර** යනුවෙන් කොටස් තුනකි. එහි උභතො විභංගය සුත්තවිභංග නමින් හැඳින්වෙන අතර එය **භික්ඛුවිභංග** හා **භික්ඛුනී විභංග** යනුවෙන් කොටස් දෙකකට ද බෙදේ.

- විනය පිටකය ග්‍රන්ථ වශයෙන් මෙසේ ප්‍රභේදගත වේ.

විභංග { පාරාජිකාපාළි / පාචිත්තියපාළි }

| | | |
|---|---|---|
| ඛන්ධක | { | චුල්ලවග්ගපාළි<br>මහාවග්ගපාළි |
| පරිවාර | - | පරිවාරපාළි වශයෙනි. |

(iv). **භාණකවරු** නම් ත්‍රිපිටකය කට පාඩමින් රැකගත් ආචාර්ය පරම්පරාවන් ය. පළමු ධර්ම සංගීතියෙන් පසු භාණක පරම්පරා බිහිවිය. **පසුව අටලොස් භාණක පරම්පරාවක් දක්වා ව්‍යාප්ත විය.** මේ අනුව දීඝනිකාය ආනන්ද හිමියන් ප්‍රධාන ශිෂ්‍ය පිරිසට ද, මජ්ඣිම නිකාය සැරියුත් තෙරණුවන්ගේ ශිෂ්‍ය පිරිසට ද, සංයුත්ත නිකාය මහාකාශ්‍යප තෙරුන්ට ද, අංගුත්තර නිකාය අනුරුද්ධ තෙරුන්ට ද, විනය පිටකය උපාලි තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට ද, සෙසු ධර්ම කොටස් පොදුවේ සියලු භික්ෂූන් වහන්සේලාට ද පවරා දෙන ලදි. පසුව ඒ ඒ ආචාර්යවරුන් මෙන් ම උන්වහන්සේලාගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරා විසින් ධර්ම විනය සුරක්ෂිත කළ අතර එමගින් භාණක පරම්පරා බිහිවිය. මෙහි දී දීඝනිකාය කට පාඩමින් රැගෙන ආ පිරිස **දීඝභාණක** නමින් ද සෙසු ධර්ම කොටස් දැරූ පිරිස් **මජ්ඣිම භාණක, සංයුත්ත භාණක, අංගුත්තර භාණක, ජාතක භාණක** යනාදී වශයෙන් ද හඳුන්වන ලදි. විනය පිටකය සුරක්ෂිත කළ පිරිස **විනයධර** වශයෙන් ද අභිධර්මය දැරූවෝ **ආභිධම්මික** වශයෙන් ද පැවත ආහ.

උක්ත ආකාරයට පැවත ආ භාණකවරුන්ගේ ප්‍රමුඛ කාර්යය වූයේ ධර්ම විනය කේවල සජ්ඣායනයෙන් හා ගණ සජ්ඣායනයෙන් වණපොත් කොට ධර්ම විරෝධී අදහස්වලට ඉඩ නො තබා සුරක්ෂිත කිරීම යි. මෙම භාණක පරම්පරා වඩාත් දියුණුවත් ම ඒ ඒ නිකාය ග්‍රන්ථ විෂයෙහි අටුවා හා ටීකා සම්පාදනයෙන් ද ධර්ම විනය සුරක්ෂිත කරන ලදි. භාණකවරු අතර විවිධ ආචාර්යවාද පැවති බවට අටුවාවල සඳහන් *'දීඝභාණකා පන වදන්ති'* යනාදී අටුවා පාඨවලින් පැහැදිලි වේ.

**ලකුණු දීමේ ක්‍රමය**

මෙම ප්‍රශ්නයේ (i) කොටසට පිළිතුරු සැපයීමේ දී නම සහ ස්ථානය දැක්වීමට ලකුණු එක බැගින් ලකුණු දෙකක් පිරිනමන්න. (ii) කොටසේ ගාථාව නිවැරදිව ලිවීමට ලකුණු දෙකක් ද එහි අදහස දැක්වීමට ලකුණු දෙකක් ද පිරිනමන්න. (iii) කොටසට අවම වශයෙන් ප්‍රභේද දෙකක්වත් දක්වා තිබිය යුතු අතර එක් ප්‍රභේදයක් දැක්වීමට උපරිමය ලකුණු 3ක් වශයෙන් සලකා ලකුණු 6ක් පිරිනමන්න. (iv) කොටසේ භාණකවරු හැඳින්වීමට ලකුණු හතරක් ද ඔවුන්ගේ කාර්යභාරය දැක්වීමට ලකුණු හතරක් ද වශයෙන් සලකා ලකුණු අටක් පිරිනමන්න.

4. (i) **පිටක** හා **සුත්ත** යන පද **දෙක** හඳුන්වන්න.
(ii) **ථූපවංශයේ** කර්තෘ, කාලය, අරමුණ හා ඊට මූලාශ්‍රය වූ පුරාණ කෘතිය නම් කරන්න.
(iii) පාලි අභිධම්ම පිටකාගත ග්‍රන්ථවලින් **තුනක්** හඳුන්වන්න.
(iv) ත්‍රිපිටකයේ ශ්‍රාවක භාෂිත දේශනා පිළිබඳ හැඳින්වීමක් සපයන්න.

(ලකුණු 2+4+6+8=20 යි.)

ආදර්ශ පිළිතුර

(i) 'පිටක' යන්නේ තේරුම **කුඩය, භාජනය,** හෝ **පැස** යන්න යි. (කුද්දාල පිටකං ආදාය) තවද **පිටක** යන්නෙන් **බුද්ධවචනය හෙවත් පර්යාප්තිය සංග්‍රහ වූ කොටස** යන අදහස ද වේ.

අර්ථ ප්‍රකාශ කරන බැවින් ද, අර්ථයන් මනාව දේශනා කොට වදාළ බැවින් ද, අර්ථයන් ප්‍රසව කරන බැවින් ද, අර්ථයන් වගුරුවන බැවින් ද, අර්ථයන් මනාව රක්නා බැවින් ද, ගෙතුණු අර්ථ නො විසිරෙණ බැවින් ද **සුත්ත** නම් වේ යැයි කීහ. තවද නවංග සත්ථු සාසනයේ **සුත්ත** යන්නෙන් අර්ථවත් වන්නේ සම්පූර්ණ විනය පිටකයත් සුත්ත නාමය සහිත සූත්‍ර පිටකයේ ඇති සියලු සූත්‍රයන් ද වේ.

(ii) **කර්තෘ** - වාචිස්සර මහාසාමි
**කාලය** - පොළොන්නරු යුගය

**අරමුණ** - මහින්දසේන පිරිවෙන්හි විසූ පිටකත්‍රය පාරගත මහතෙරුන්ගේ ආරාධනය ඉටුකිරීම සඳහා පෙර සිහළ බසින් සම්පාදිත ථූපවංශය දේශාන්තර වැසියන්ට ප්‍රයෝජනවත් නො වන නිසාත් එහි භාෂාත්මක දුර්වලතා ආදිය මගහැරවීම සඳහාත් රචනා කර ඇත. එසේම රුවන්වැලි සෑරදුන්ගේ ඉතිහාස කථාව ගෙනහැර දැක්වීම ද මෙහි අරමුණකි.
**මූලාශ්‍රය** - පෙර සිංහල බසින් රචනා කළ ථූපවංසය.

**(iii) අභිධර්ම පිටකය**

**ධම්මසංගණීප්පකරණ**

මෙහි චිත්තුප්පාද කාණ්ඩ, රූප කාණ්ඩ, නික්ඛෙප කාණ්ඩ අට්ඨකථා කාණ්ඩ යැයි කොටස් 4 කි. කාමාවචරාදී සිත් චිත්තුප්පාද කාණ්ඩයෙහි විස්තර කර ඇත. රූප කාණ්ඩයෙහි රූපයන්ගේ ප්‍රභේද නික්ඛෙප කාණ්ඩයෙහි **කුසලාධම්මා** ආදිය වෙන් වෙන් වශයෙන් විවරණය කර ඇත. අට්ඨකථා කාණ්ඩයෙහි එක් එක් පදයට ඇතුළත් ධර්මයන් දක්වා ඇත.

**විභංගප්පකරණ**

විභංග යනු බෙදා දැක්වීම යි. මෙහි විභංග අටළොසක් ඇතුළත් ය. ඛන්ධ, ආයතන, ධාතු, සච්ච, ඉන්ද්‍රිය, පටිච්චසමුප්පාද, සතිපට්ඨාන, සම්මප්පධාන, ඉද්ධිපාද, බොජ්ඣංග, මග්ගඞ්ග ධ්‍යාන, අප්පමඤ්ඤා, සික්ඛාපද, පටිසම්භිදා ඤාණ, ඛුද්දකවත්ථු, ධම්මපද වශයෙනි.

**ධාතුකථාප්පකරණ**

ධාතූන් පිළිබඳ කථාව **ධාතුකථා** නම්. ස්කන්ධ ආයතන ධාතු නානාකාරයෙන් බෙදා දක්වා ඇති හෙයින් මෙය ධාතුකථා නම්. රූපස්කන්ධය ආදී ස්කන්ධ ධර්ම කෙතෙක් ආයතන විසින් කෙතෙක් ධාතූන් විසින් සංගෘහිත වෙත් ද යනාදී ප්‍රශ්න විචාරා පිළිතුරු සපයා ඇත.

**පුග්ගලපඤ්ඤත්තිප්පකරණ**

**පඤ්ඤත්ති** යනු පැනවීම යි. පුග්ගලපඤ්ඤත්තියෙහි පැනවීම් 6 කි. ඛන්ධ පඤ්ඤත්ති, ආයතන පඤ්ඤත්ති, ධාතු පඤ්ඤත්ති, සච්ච පඤ්ඤත්ති, ඉන්ද්‍රිය පඤ්ඤත්ති, පුග්ගල පඤ්ඤත්ති යනුවෙනි. අවසාන කොටසේ නම වෙනම යොදා ඇත.

**කථාවත්ථුප්පකරණ**

මෙය තෙවන සංගීතියෙන් පසුව මොග්ගලීපුත්තතිස්ස තෙරුන් විසින් සම්පාදිත කෘතියකි. පුග්ගලවාද සබ්බමත්ථිවාද ලොකුත්තරවාද ආදී කථා මෙහි සාකච්ඡාවට භාජනය වේ. බණවාර 35 කි. පරවාද 500ක් ඛණ්ඩනය කොට සකවාද 500ක් මණ්ඩනය කරනු වස් රචනා කර ඇති බව කියැවේ.

**යමකප්පකරණ**

**යමක** යන්නෙහි තේරුම යුගල යන්න යි. මෙහි යමක 10 ක් ඇතුළත් ය. මූල යමක, ඛන්ධ යමක, ආයතන යමක, ධාතු යමක, සච්ච යමක, සංඛාර යමක, අනුසය යමක, චිත්ත යමක, ධම්ම යමක, ඉන්ද්‍රිය යමක වශයෙනි.

**පට්ඨානප්පකරණ**

අභිධර්ම පිටකයෙහි විශාල වූත් ගැඹුරු වූත් ග්‍රන්ථය මෙයයි. මෙහි අනුලෝම පට්ඨාන, පච්චනිය පට්ඨාන, අනුලෝම පච්චනිය පට්ඨාන, පච්චනියානුලෝම පට්ඨාන වශයෙන් බෙදීම් 4 කි. මෙම එක් එක් බෙදීම නැවත දුක පට්ඨාන, තික පට්ඨාන, දුකතික පට්ඨාන, තිකදුක පට්ඨාන, තිකතික පට්ඨාන, දුකදුකපට්ඨාන, වශයෙන් කොටස් 6 කි. මෙසේ පට්ඨාන සූවිස්සකි. මෙය සූවිසි ප්‍රත්‍යයෙහි විස්තර වේ.

(iv) ත්‍රිපිටකයේ ශ්‍රාවක භාෂිත දේශනා රාශියක් වේ.

දීඝනිකායේ **සම්පසාදනීය, සුභ, පායාසිරාජඤ්ඤ, සංගීති** හා **දසුත්තර** සූත්‍ර ශ්‍රාවක භාෂිතයන් ය.

මජ්ඣිම නිකායේ **අනංගණ** ආදී සූත්‍ර රාශියක් ශ්‍රාවකයන් විසින් දේශිත ය.

සංයුත්ත හා අංගුත්තර නිකායන්හි **මහාකච්චායන, සාරිපුත්ත** ආදී තෙරවරුන් දේශිත සූත්‍ර සමූහයක් ඇත.

ඛුද්දක නිකායේ **අපදානපාළි ථෙරගාථා ථෙරීගාථා** ඒ ඒ තෙරවරුන් විසින් දේශිත උදානයන්ගෙන් සමන්විත ය. **නිද්දෙසපාළි** හා **පටිසම්භිදාමග්ගපාළි** සැරියුත් තෙරුන්ගේ රචනයකි.

විනය පිටකයේ **පරිවාරපාළිය** ලංකාවේ භික්ෂුවක වූ දීප නම් තෙර කෙනෙකුගේ කෘතියකැයි අනුමාන කෙරේ.

අභිධර්ම පිටකයේ **කථාවත්ථුප්පකරණය** මොග්ගලීපුත්ත තෙරුන් විසින් තෙවන ධර්ම සංගීතියෙන් පසුව සම්පාදිත ය. මෙසේ බොහෝ දේශනාවන් ශ්‍රාවක භාෂිත සේ වන අතර ධර්මස්කන්ධ වශයෙන් 84,000 ක් වූ ධර්මස්කන්ධයන්ගෙන් 2000 ක් පමණ ශ්‍රාවක භාෂිත වේ.

**ලකුණු දීමේ ක්‍රමය**

මෙම ප්‍රශ්නයේ (i) කොටසට ලකුණු ලබාදීමේ දී එක කරුණකට එක බැගින් ලකුණු **දෙකක්** පිරිනමන්න. (ii) කොටසේ කරුණු හතරට එක ලකුණ බැගින් ලකුණු **හතරක්** පිරිනමන්න. (iii) කොටසේ එක ග්‍රන්ථයක් හැඳින්වීමට ලකුණු දෙක බැගින් ලකුණු **හයක්** පිරිනමන්න. (iv) කොටසට පිළිතුරු සැපයීමේ දී ශ්‍රාවක භාෂිත දේශනා (සූත්‍ර විනය අභිධර්ම පිටක ආශ්‍රයෙන්) ක්ෂේත්‍ර හතරක්වත් නියෝජනය වන පරිදි පිළිතුරු සපයා තිබිය යුතු අතර එක් කරුණකට ලකුණු දෙක බලින් ලකුණු අට (08) පිරිනමන්න.

## III කොටස

**5.** (i) පහත දැක්වෙන පද විසන්ධි කොට **සන්ධිය** නම් කරන්න.

(අ) එකච්ඡත්තං (ඌ) මහාරහං
(ආ) දක්ඛිණෝදකං (එ) තස්සෙතං
(ඉ) ඉදමාහ (ඒ) පුනප්පුනං
(ඊ) ඉච්චෙවං (ඔ) වාපිමගා
(උ) කින්නාමත්ථි (ඕ) විහාරස්සුව

(ii) පහත දැක්වෙන පද අයත්වන **සමාසය** නම් කරන්න.

(අ) දසබලො (ඌ) රතනත්තයං
(ආ) මනුජාධිපො (එ) අන්නපානං
(ඉ) අභයවාපි (ඒ) යථාරහං
(ඊ) දණ්ඩකම්මං (ඔ) රාජසෙනා
(උ) විකාලභොජනං (ඕ) අප්පමත්තො

(iii) පහත දී ඇති වාක්‍යවල **සදොස්** තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.
(අ) සත්ථා චත්තාරි පුග්ගලා කථිතා.
(ආ) සො තත්ථ යාවතායුකං ඨත්වා යථාකම්මො ගතා.
(ඉ) තෙ අත්තනි වසනට්ඨානමෙව අගමාසි.
(ඊ) ආරද්ධවීරියො සුඛං විහරති පවිවිත්තා පාපකෙන ධම්මෙහි.
(උ) සත්ථවාහකජෙට්ඨකො පන මයමෙව අහොසින්ති දෙසනා නිට්ඨපෙසි.

(iv) පහත වගුවේ **A** තීරුවේ දැක්වෙන ග්‍රන්ථ වාචෝද්ගතව ආරක්ෂා කිරීම පිණිස ප්‍රථම ධර්මසංගායනාවේදී පවරණු ලැබූ භික්ෂු පිරිස **B** තීරුවෙන් තෝරාගෙන ගළපා ලියන්න.

| | A | B |
|---|---|---|
| අ | දීඝනිකාය | උපාලි හිමි ප්‍රමුඛ සිසු පිරිස |
| ආ | මජ්ඣිමනිකාය | අනුරුද්ධ හිමි ප්‍රමුඛ සිසු පිරිස |
| ඉ | සංයුත්තනිකාය | ආනන්ද හිමි ප්‍රමුඛ සිසු පිරිස |
| ඊ | අංගුත්තරනිකාය | සැරියුත් හිමියන්ගේ සිසු පිරිස |
| උ | විනය පිටකය | මහාකාශ්‍යප හිමි ප්‍රමුඛ සිසු පිරිස |

(ලකුණු 5+5+5+5 =20 යි)

05 (i) ආදර්ශ පිළිතුර

(අ) එක + ජත්තං - ව්‍යඤ්ජන සන්ධිය

(ආ) දක්ඛිණා + උදකං - ස්වර සන්ධිය

(ඉ) ඉදං + ආහ - නිග්ගහීත සන්ධිය

(ඊ) ඉති + එවං - ස්වර සන්ධිය

(උ) කිං + නාම + අත්ථි - නිග්ගහීත/ස්වර සන්ධිය

(ඌ) මහා + අරහං - ස්වර සන්ධිය

(එ) තස්ස + එතං - ස්වර සන්ධිය

(ඒ) පුන + පුනං - ව්‍යඤ්ජන සන්ධිය

(ඔ) වාපිං + අගා - නිග්ගහීත සන්ධිය

(ඕ) විහාරං + ච - නිග්ගහීත සන්ධිය

(ii) (අ) බහුබ්බීහි සමාස

(ආ) තප්පුරිස සමාස

(ඉ) කම්මධාර සමාස

(ඊ) තප්පුරිස සමාස

(උ) තප්පුරිස සමාස

(ඌ) කම්මධාර සමාසය

(එ) ද්වන්ද සමාස

(ඒ) අබ්‍යයීභාව සමාස

(ඔ) තප්පුරිස සමාස

(ඕ) කම්මධාර සමාස

(iii) (අ) **සත්ථාරා චත්තාරො** පුග්ගලා කථිතා.

(ආ) සො තත්ථ යාවතායුකං ඨත්වා **යථාකම්මං ගතො.**

(ඉ) තෙ **අත්තානං** වසනට්ඨානමෙව **අගමංසු.**

(ඊ) ආරද්ධවිරියො සුඛං විහරති **පවිවිත්තො පාපකෙහි** ධම්මෙහි.

(උ) සත්ථවාහකජෙට්ඨකො පන **අහමෙව** අහොසින්ති **දෙසනං** නිට්ඨපෙසි.

(iv) (අ) දීඝනිකාය - ආනන්ද හිමි ප්‍රමුඛ සිසු පිරිසි

(ආ) මජ්ඣිමනිකාය - සැරියුත් හිමියන්ගේ සිසු පිරිස

(ඉ) සංයුත්තනිකාය - මහාකාශ්‍යප හිමි ප්‍රමුඛ සිසු පිරිස

(ඊ) අංගුත්තරනිකාය - අනුරුද්ධ හිමි ප්‍රමුඛ සිසු පිරිස

(උ) විනය පිටකය - උපාලි හිමි ප්‍රමුඛ සිසු පිරිස

**ලකුණු දීමේ ක්‍රමය**

මෙම ප්‍රශ්නයේ (i) හා (ii) කොටස්වල නිවැරදි පිළිතුරුකට ලකුණු භාගය බැගින් හිමි වේ. (5+5). (iii) කොටසේ එක් වාක්‍යයක නිවැරදි කිරීම් දෙකක් ඇත. එක් නිවැරදි කිරීමකට ලකුණු භාගය බැගින් සලකා ලකුණු පහක් පිරිනමන්න. (iv) එක් නිවැරදි ගැළපීමකට එක් ලකුණ බැගින් ලකුණු පහකි.

6. (i) **"යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා..."** යනාදි ගාථාවෙහි අදහස ලියා දක්වන්න.
(ii) ධාර්මික දිවි පැවැත්ම, ජාතක කථාවන්හි එන චරිත **පහක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.
(iii) **ඝරාවාසධම්ම** යන්නෙන් නිර්දේශිත ගෘහස්ථ ජීවිත ප්‍රතිපදාව ධම්මික සූත්‍රය ඇසුරෙන් පෙන්වා දෙන්න.
(iv) රතන සූත්‍රයෙහි දැක්වෙන සංඝරත්නයේ ගුණ පිළිබඳ සමාලෝචනයක් කරන්න.
(ලකුණු 5+5+5+5 =20 යි)

06. ආදර්ශ පිළිතුරු

I. මෙලොව හෝ පරලොව හෝ යම් කිසි ධනයක් වේ ද ස්වර්ගයන්හි යම් උතුම් වූ රත්නයක් වේ ද තථාගතයන් වහන්සේට සමාන වූ රත්නයක් නොම ඇත්තේ ය. බුදුරදුන් කෙරෙහි මෙය ද ශ්‍රේෂ්ඨ වූ රත්න භාවයකි. මේ සත්‍යයෙන් සෙත්වේවා.

II.
- සේරිවාණි ජාතකයේ බෝසත් වෙළන්දාගේ ධාර්මික වෙළඳාම
- දෙවධර්ම ජාතකයේ මහිංසාසක කුමරු (බෝසතාණන් වහන්සේ) කිසිදු හේතුවක් නිසා ලෝක ධර්ම (හිරි ඔතප්) නො කැඩීම.
- සේරිවාණිජ ජාතකයේ සිටු මිත්තණිය හා දියණිය තම කුලය ජරාජීර්ණ තත්ත්වයට පත් වූ කල්හි අධාර්මික ලෙස ජීවත් නො වී බැල මෙහෙවරකොට ජීවත්වීම.
- චුල්ලසෙට්ඨි ජාතකයේ මුත්තණුවෝ මුණුබුරන් රැකබලා ගැනීම
- වණ්ණුපථ ජාතකයේ සාත්තු නායකයා විපත් වූ වෙලාවෙහි අතවැසියන්ගේ සහ සතුන්ගේ ජීවිත බේරා ගැනීම වෙනුවෙන් මහත් කැපවීමකින් ක්‍රියා කිරීම.

III.
- ප්‍රාණඝාතය කිරීම, කරවීම හා එය අනුමත කිරීම නො කරන්නේ ය, නො කරවන්නේ ය.
- සොරකම් කිරීම කරවීම හා එය අනුමත කිරීම නො කරන්නේ ය, නො කරවන්නේ ය.
- පරදාර සේවනය නො කරන්නේ ය.
- බොරුකීම. කියවීම හා එය අනුමත කිරීම නො කරන්නේ ය.
- මත්පැන් බීම, පෙවීම හා මද්‍යපානය අනුමත කිරීම නො කරන්නේ ය.
- බාලයන්ට ප්‍රිය වූ අපුඤ්ඤායතන අත්හරින්නේ ය.
- පොහෝදින අෂ්ටාංගික උපෝෂථය සමාදන් වන්නේ ය.
- සතුටු සිතින් භික්ෂූන්ට ආහාර පානවලින් සංග්‍රහ කරන්නේ ය.
- දැහැමින් මව්පියන් පෝෂණය කරන්නේ ය.
- දැහැමිව වෙළඳාම් කරන්නේ ය.

iv
- දක්ෂිණාර්හ බව
- දෙන ලද මද දෙයිනුදු දායකයනට මහත්ඵල ලබා දෙන බව
- ස්ථිර සමාධියෙන් යුක්ත හා පිරිසිදු කායවාග් ප්‍රයෝග ඇති බව
- කෙලෙසුන් කෙරෙන් නික්ම නිවන් වැද ඵලසමවත් සුව විඳින බව

- ඉන්ද්‍රඛීලයක් මෙන් අටලෝ දහමෙන් කම්පා නො වන බව
- චතුරාර්ය සත්‍යය නුවණින් තත් වූ පරිදි දන්නා බව
- නිර්වාණ මාර්ගයට පිවිස අටවන භවයකට නො එළඹ නිවන් දක්නා බව
- සංයෝජන ප්‍රහාණයෙන් සතර අපායෙන් මිදුණු බව සවැදෑරුම් මහා පාපයන් කිරීමට අයෝග්‍ය බව
- සිහිමුළාවකින් හෝ යම් අකුසලයක් කෙරේ ද, කයෙන් හෝ වචනයෙන් එය නො සඟවා ප්‍රකාශ කරන බව
- පැරණි කර්ම ක්‍ෂය කළ බව, නව කර්ම රැස් නො කරන බව හා අනාගත භවයෙක්හි නො ඇලුණු සිත් ඇති බව

**ලකුණු දීමේ ක්‍රමය**

මෙම ප්‍රශ්නයේ (i) කොටසේ ගාථාවේ අදහස නිවැරදිව ලියා දක්වා ඇත්නම් ලකුණු පහක් හිමි වේ. අඩුපාඩු සහිතව අරුත් දැක්වීමට සුදුසු පරිදි ලකුණු අඩුකරන්න. (ii) කොටසේ එක් පැහැදිලි කිරීමකට එක් ලකුණ බැගින් ලකුණු පහකි. කරුණු පැහැදිලි කර නැත්නම් ලකුණු හිමි නො වේ. (iii) කොටසට පිළිතුරු සැපයීමේ දී අවම වශයෙන් කරුණු පහක්වත් පෙන්වා දිය යුතු අතර එක් කරුණකට එක් ලකුණ බැගින් ලකුණු පහක් හිමි වේ. (iv) කොටසට පිළිතුරු සැපයීමේ දී ගුණ පහක්වත් දක්වා තිබිය යුතු අතර එක් කරුණකට එක් ලකුණ බැගින් ලකුණු පහක් පිරිනැමිය යුතු ය.